PN/WHT/2020-04
31.03.2020

# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## බදු ගෙවන්නන් වෙත කෙරෙන නිවේදනයයි

**2020 පෙබරවාරි සහ මාර්තු මාස සඳහා වන**

**රඳවා ගැනීමේ බදු ගෙවීම්**

කොවිඩ් -19 වෛරස ව්‍යාප්තිය හේතුවෙන් ලබා දී ඇති සහන පිළිබඳව 2020 මාර්තු 23 වන දිනැතිව ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ලබා දුන් උපදෙස් මාලාවට සමගාමීව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රඳවා ගැනීමේ බදු සම්බන්ධයෙන් පහත කරුණු දැනුම් දෙනු ලැබේ.

2020 පෙබරවාරි මාසය සඳහා 2020 මාර්තු මස 15 දිනට නියමිතව තිබූ සහ 2020 මාර්තු මාසය සඳහා 2020 අප්‍රේල් 20 දිනට නියමිත රඳවා ගැනීමේ බදු ගෙවීමට යටත් වන රඳවා ගැනීමේ අනුයෝජිතයන් සහ රඳවා ගනු ලැබීමට යටත්වන්නන් වෙත [2020.02.18 දිනැති PN/IT/2020-03 (amended) නිවේදනයෙන් දැනුම් දී ඇති සංශෝධනයන්ට යටත්ව] අදාළ ගෙවීම් කිරීම සඳහා 2020 අප්‍රේල් 30 වන දින දක්වා ඉඩ දෙනු ලැබේ.

ඒ අනුව, ඉහත සඳහන් කාල සීමා සඳහා 2020 අප්‍රේල් 30 දින හෝ එදිනට පෙර කරනු ලබන ගෙවීම්, නියමිත දිනට කරන ලද ගෙවීම් ලෙස සලකනු ලබන අතර පද්ධතිය මගින් ඉහත සඳහන් කාල සීමා සඳහා ප්‍රමාද ගෙවීම් මත පනවනු ලබන දණ්ඩන ඉවත් කරනු ලැබේ.

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

බදු - වඩා හොඳ අනාගතයකට